# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 20 දරන
# අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාම මහා විහාර දායක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පිට මුද්‍රණය කරන ලදී.

---

1993 අප්‍රේල් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. නැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1993 අංක 20 දරන අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාම මහා විහාර දායක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 70/91

**අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාම මහා විහාර දායක සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාම මහා විහාර දායක සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් දොඩන්ගස්ලන්දේහි පිහිටුවා තිබුණ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකම ක්‍රියාත්මක කර සහ ඉටු කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1993 අංක 20 දරන අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාම මහා විහාර දායක සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "දායක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාම මහා විහාර දායක සභාවේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන සාමාජිකයන් "අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාම මහා විහාර දායක සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එම සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා එය පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාම මහා විහාර දායක සභාව සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බෞද්ධ සම්බන්ධතා වැඩිදියුණු කිරීම ;

(ආ) අලකොළමඩ ශ්‍රී ජයසුමනාරාම මහා විහාරය සහ ඊට අනුබද්ධ ශ්‍රී ධම්මාධාර මහා පිරිවෙණ සඳහා අවශ්‍ය දෑ සැපයීම සහ ඒවා නඩත්තු කිරීම ;

(ඇ) ඉහත කී විහාරස්ථානය සහ පිරිවෙණ භූමි භාගයේ පිහිටි පූජනීය සහ සංස්කෘතික වැදගත්කමක් ඇති ස්ථාන ආරක්ෂා කිරීම හා ඒවා සංවර්ධනය කිරීම ;

(ඈ) එකී විහාරය සහ පිරිවෙන සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම, අළුත්වැඩියා කිරීම හා ඒවා නඩත්තු කිරීම සහ එකී විහාරස්ථානයේ සහ පිරිවෙණෙහි නේවාසික භික්ෂූන් වහන්සේලාගේ සුභ සිද්ධිය සඳහා විදුලිබලය, ජලය සහ වෙනත් පහසුකම් සැපයීම ;

(ඉ) එකී විහාරස්ථානයේ සහ පිරිවෙණේ නේවාසික භික්ෂූන් වහන්සේලාට සහ ඊට පැමිණෙන භික්ෂූන් වහන්සේලාට සිවුපසය සහ වෙනත් පහසුකම් සැලසීම ;

(ඊ) භික්ෂූන් වහන්සේලා සහ ගිහියන් අතර සහයෝගතාවය සහ අවබෝධය ඇතිකරලීම සහ එමගින් එම ප්‍රදේශය ඇතුළත ජාතික, ආගමික, සමාජ, අධ්‍යාපනික සහ සංස්කෘතික නැංවීමක් ඇතිකරලීම ;

(උ) දිළිඳු සහ අසරණ අය සඳහා නිවාස ඉදිකිරීම සහ ඒවා අළුත් වැඩියා කිරීම ;

(ඌ) පිරිවෙණෙහි ශිෂ්‍ය භික්ෂූන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම සහ ප්‍රදේශයේ සුදුසු ශිෂ්‍යයන්ට තම අධ්‍යාපනය වැඩිදුර වත් කරගෙන යාම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(එ) ප්‍රදේශයේ ළමයින් සහ යෞවනයන් උදෙසා විනෝද පහසු කම් සැලසීම ; සහ

(ඒ) ස්වාභාවික ආපදාවන්හිදී සහ අනපේක්ෂිත අවස්ථාවල දී සහන සහ සුභසාධන ක්‍රියා මාර්ග සැලසීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව පහත දැක්වෙන පරිදි සංයුක්ත වූ පාලක සභාවක් මගින් පාලනය කළ යුතු ය :--

(අ) සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට අනුකූලව නම් කරනු ලැබූ අනුශාසක මණ්ඩලයේ සාමාජිකයන් ; මොවුනතුරෙන් ශ්‍රී ජයසුමනාරාම මහා විහාරාධිපතීන් වහන්සේ ප්‍රධාන පැවිදි අනුශාසකවරයා විය යුතු අතර පිදීගම සහකාර දිසාපතිවරයා ප්‍රධාන ගිහි අනුශාසකවරයා විය යුතුය ;

(ආ) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව යම් මහා සභා රැස්වීමකදී තෝරාපත් කරගනු ලබන සභාපති වරයා, උපසභාපතිවරයා, ප්‍රධාන ලේකම්වරයා, උප ලේකම් වරයා, භාණ්ඩාගාරිකවරයා සහ විගණකවරයා ;

(ඇ) සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූද ඒ රීතිවලට අනුකූලව පත්කරනු, තෝරා පත්කරනු හෝ නම් කරනු ලබන්නාවූ ද වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවක්.

(2) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට අදාළ කාරණා පිළිබඳව දායක සභාවට උපදෙස් දීම අනුශාසක මණ්ඩලයේ කාර්යය වන්නේය.

(3) සංස්ථාවේ ප්‍රථම පාලක සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දරන දායක සභාවේ පාලක සභාව විය යුතු ය.

(4) අනුශාසක මණ්ඩලයේ සාමාජිකයන් හැර සභාවේ අන් සෑම සාමාජිකයෙකුම අවුරුදු දෙකක කාල සීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, ඒ කාලසීමාව අවසානයේදී සංස්ථාවේ මහා සභා රැස්වීමකදී හෝ තත්කාර්යය සඳහා කැඳවනු ලැබූ විශේෂ මහා සභා රැස්වීමක දී ඔහුගේ අනුප්‍රාප්තිකයා තෝරා පත්කර ගත යුතු ය.

(5) තම කාර්ය නොසලකා සිටීම සඳහා හෝ වංචාව සඳහා හෝ නෙරපනු නොලැබූ පාලක සභාවේ යම් සාමාජිකයෙකු නැවත තෝරා පත් කර ගනු ලැබිය හැකි ය.

සංස්ථාවේ රීති.

5. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහාද, පාලක සභාවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාම සඳහා ද, පාලක සභාවේ සහ සංස්ථාවේ කට යුතු කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි යම් රීතියක් සෑදීමෙන් පසු තත්කාර්යය සඳහා කැඳවනු ලැබූ රැස්වීමකදී එවැනිම ආකාරයෙන් එය වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය :

එසේ වුවද ඒ වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම පාලක සභාව විසින් අනුමත කරනු ලැබුව හොත් මිස, බල සහිත නොවිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී, දායක සභාවේ බලපැවැත්වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම විටම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

6. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්තමේන්තු නියාදනය කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලබන චංචල හෝ නිශ්චල හෝ යම් දේපළක් ගැනීමට හා දැරීමට නීතිය අනුව හැකියාව හා ශක්‍යතාව සංස්ථාවට ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ සම්පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා ඒ සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

7. (1) සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද, සේවක පිරිස් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ හිතකර කවරාකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද, කාරණා ඉටු කිරීමේ ද, දේවල් ක්‍රියාත්මක කිරීමේ ද බලය මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

(2) 6 වන වගන්තියෙන් සහ මේ වගන්තියේ (1) වන උප වගන්තියෙන් සංස්ථාව වෙත පවරා දෙන ලද බලතල පාලක සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

දායක සභාව විසින් ගෙවිය යුතු හා දායක සභාවට අයවිය යුතු ණය.

8. මේ පනතේ කාර්ය සඳහා මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී දායක සභාවේ පැවති සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, දායක සභාවට එදිනට අයවිය යුතු සියලු ණය සහ දායක සභාවට ගෙවිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම තම අත්සන් කළ යුතු ය. තවද, ඒ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**පාර්ලිමේන්තුවේ** සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක **මිල** (දේශීය) රු. 870 යි. **(විදේශීය) රු. 1,100** යි. අංක 85, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ **අධිකාරි වෙත සෑම වර්ෂයකම** දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන **එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.**